# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1851/7 – 2014 පෙබරවාරි මස 24 වැනි සඳුදා - 2014.02.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

2013 වර්ෂයේ අංක 02 දරන නැගෙනහිර පළාත් නිවාස ඉදිකිරීමේ අධිකාරියේ ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ෧(1) වැනි ව්‍යවස්ථාවේ නියමයන්ට අනුකූලව 2014.02.13 දින නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුඥාව ලැබූ 2013 වර්ෂයේ අංක 02 දරන නැගෙනහිර පළාත් නිවාස ඉදිකිරීම් අධිකාරියේ ප්‍රඥප්ති පහත සඳහන් ලේඛනයේ විස්තර කරනු ලබන ආකාරයෙන් නැගෙනහිර පළාත් සභාවේ පළාත් සභා ලේකම් වන මොහොමඩ් කාසිම් මොහොමඩ් ෂෙරීෆ් වන මා ආණ්ඩුකාරවරයාගේ අනුඥාව ලැබූ දින සිට ක්‍රියාත්මක වන ලෙස මෙයින් පළකර නියෝග කරමි.

එම්. සී. එම්. ෂෙරිෆ්,<br>
පළාත් සභා ලේකම්,<br>
නැගෙනහිර පළාත් සභාව.

2014 පෙබරවාරි මස 20 වැනි දින.<br>
පළාත් සභා ලේකම් කාර්යාලය,<br>
නැගෙනහිර පළාත් සභාව,<br>
ත්‍රිකුණාමලය.

**2013 වර්ෂයේ අංක 02 දරණ නැගෙනහිර පළාත් නිවාස ඉදිකිරීමේ අධිකාරියේ ප්‍රඥප්තිය**

නැගෙනහිර පළාත් නිවාස ඉදිකිරීම් අධිකාරියක් ස්ථාපිත කිරීම, පළාත් නිවාස සැළසුම් කිරීම සහ ව්‍යාපෘති දියත් කිරිම, අධීක්ෂණය කිරීම, සේවක පිරිස් පත් කිරීම සහ ඒ හා බැඳි හෝ එයට සමගාමීව ක්‍රියාවන් සදහා විධි විධාන කිරීමේ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය ජාතික නිවාස ඉදිකිරීම් පනත (පරිච්ඡේදය 401) ට නොඅනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නැගෙනහිර පළාත් සභාව විසින් පහත සඳහන් පරිදි පනවනු ලැබේ.

01 මෙම ප්‍රඥප්තිය 2013 වර්ෂයේ අංක 02 දරණ නැගෙනහිර පළාත් සභාවේ නිවාස ඉදිකිරීම් අධිකාරී ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගන්නා දිනයේ සිට බලාත්මක විය යුතුය, ලුහුඩු නාමයෙන් සහ බලාත්මක කරනු ලබන දිනය



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*01 කොටස*

*නැගෙනහිර පළාත් නිවාස ඉදිකිරීම් අධිකාරිය ස්ථාපිත කිරීම*

පළාත් නිවාස ඉදිකිරීම් අධිකාරිය ස්ථාපිත කිරීම

02 (1) මින් මතු, "නිවාස ඉදිකිරීම් අධිකාරිය", යනුවෙන් හඳුන්වනු ලබන අතර හා නැගෙනහිර පළාත් නිවාස ඉදිකිරීම් අධිකාරිය යනුවෙන් හදුන්වන පළාත් නිවාස ඉදිකිරීම් අධිකාරියක් මෙයින් ස්ථාපනය කළ යුත්තේය.

(2) (1) වන උප වගන්තියෙන් ඊට පැවරෙන නාමයෙන් සංස්ථාපිත විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතුය. අධිකාරිය විසින් එහි නාමයෙන් නඩු පැවරීමටද ඊට විරුද්ධව නඩු පවරනු ලැබීමද කළ හැකිය.

(3) පළාත් අමාත්‍ය සුදුසු යැයි හැඟෙන අවස්ථාවල නිවාස ඉදිකිරීම් අධිකාරිය ප්‍රධාන ලේකම් සමග සාකච්ඡා කිරීම සමග අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශය හා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් ශාඛා කාර්යාලයක් පිහිටුවා නඩත්තු කළ හැකිය.

නිවාස ඉදිකිරීම් අධිකාරියේ සාමාජිකයින්

03 (1) නිවාස ඉදිකිරීම් අධිකාරිය පහත සදහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය

(අ) මින්මතු, "පත් කරන ලද සාමාජිකයන් ", යනුවෙන් සඳහන් කරනු ලබන සාමාජිකයින් පස් දෙනෙක් නිවාස ඉදිකිරීම් සඳහා භාරව සිටින අමාත්‍යවරයා විසින් මූල්‍ය, පරිපාලන, වාණිජ හා ඉදිකිරීම් තාක්ෂණය යන විෂයන්හි පළපුරුදු සහ අත්දැකීම් සහිත තැනැත්තන් බවට පිළිගත හැකි අයවලුවන් බවට පළාත් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ, සහ

(ආ) පදවි නාමයෙන් සාමාජිකයන් හතර දෙනෙකු

(i) නිවාස ඉදිකිරීම් භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම්

(ii) නැගෙනහිර පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, මුදල්

(iii) මෙම ප්‍රඥප්තිය බලාත්මක වූ දිනට නැගෙනහිර පළාත් නිවාස ඉදිකිරීම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් අධ්‍යක්ෂ තනතුරක් ඇතිකර පත්කර නැති අවස්ථාවේ එම පත්වීම් ක්‍රියාත්මක වන එම දින දක්වා නැගෙනහිර පළාත් සභාවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා,

(iv) නැගෙනහිර පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, සැලසුම්

(2) නිවාස ඉදිකිරීම් යන විෂය භාරව පළාත් අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයන් අතරේ එක් පුද්ගලයෙක් නිවාස ඉදිකිරීම් අධිකාරිය සඳහා සභාපති වශයෙන් පත් කරනු ලැබේ.

(3) යම් තැනැත්තෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා හෝ මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්වීමෙන් හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ යම්කිසි පළාත් පාලන ආයතනයක සාමාජිකයෙකු හෝ ලාංකික පුරවැසියෙකු නොවන අයෙකු නිවාස ඉදිකිරීම් අධිකාරියේ සාමාජිකයෙකු ලෙස පත් කිරීමට හෝ සාමාජිකයෙකු ලෙස සිටීමට නුසුදුසු වේ.

(4) පළාත් අමාත්‍යවරයා විසින් යම් පුද්ගලයෙකු නිවාස අධිකාරියේ සාමාජිකයෙකු ලෙස පත් කිරිමට පෙර එම තැනැත්තා නිවාස ඉදිකිරීම් අධිකාරියේ සාමාජිකයෙකු යනුවෙන් සිය කාර්ය පටිපාටිය ඉටු කිරීමෙන් සහ ඔහුගේ මූල්‍යමය හෝ අනෙකුත් කාර්යයන්ට කිසිදු අගතියක් නොවන බවට සෑහිමට පත්විය යුතුය. නිවාස ඉදිකිරීම් අධිකාරියේ යම් සාමාජිකයෙකුට කිසියම් එවැනි උනන්දුවක් නොතිබූ බවට පළාත් අමාත්‍යවරයා විසින් විටින් විට සෑහිමකට පත් විය යුතුය. පළාත් අමාත්‍යවරයා විසින් නිවාස ඉදිකිරීම් අධිකාරියට සාමාජිකයින් සේ පත් කරනු ලබන හෝ පත් කිරීමට නියමිත යම් තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් යම් ඉල්ලීමක් කළ විට හෝ ඒ අනුව මෙම උප වගන්තියේ අරමුණ සඳහා අනුකූලව එම තැනැත්තා විසින් සිය

රාජකාරිය ඉටු කිරීම සම්බන්ධව අමාත්‍යවරයා අවශ්‍ය බවට කියනු ලබන එම තොරතුරු එම තැනැත්තා විසින් පළාත් අමාත්‍යවරයාට ඉදිරිපත් කළ යුතුය.

(5) උප වගන්ති (7) සහ (8) හි විධිවිධානවලට අනුකූලව නිවාස ඉදිකිරිම් අධිකාරියේ එක් එක් පදවි නාම සාමාජිකයින්ගේ පදවි කාලවකවානුවේ අමාත්‍යවරයා පත්වීම් කරනු ලබන අවස්ථාවේ තිරණය කරනු ලබන අතර, ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු 3කට නොවැඩි විය යුතු අතර, උප වගන්ති (7) හිදි ඔහු ඉවත් නොකළහොත් ඔහුව නැවත පත් කිරීම සඳහා සුදුස්සෙකු විය යුතුය.

කෙසේ නමුත් අමාත්‍යවරයා විසින් නිවාස ඉදිකිරීම් අධිකාරියේ පදවි නාම සාමාජිකයෙකුගේ පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරන ලද එවැනි සාමාජිකයෙක් ඔහු තනතුරෙන් ඉවත් නොකළ අවස්ථාවක ඔහු කුමන සාමාජිකයෙකු සඳහා පත් කළද ඔහු එම සාමාජිකයාගේ ඉතිරි කාලවකවානුව සඳහා පමණක් එම තනතුරේ නියැලි සිටිනු ඇත.

(6) උප වගන්ති (8) හි සඳහන් විධිවිධානවලට අනුකූලව සභාපතිවරයාගේ පදවි කාල පරිච්ඡේදය නිවාස ඉදිකිරීම් අධිකාරියේ ඔහුගේ සාමාජික කාලයට අනුරූපව ඇත.

(7) පළාත් අමාත්‍යවරයා විසින් කිසියම් පත් කරන ලද සාමාජිකයෙකුට කිසියම් හේතු පෙන්වා තනතුරෙන් පහ කිරීමේ නියෝගයක් නිකුත් කළ හැකිය

(8) උප වගන්ති (7) හි සඳහන් පළාත් අමාත්‍යවරයා විසින් කුමන හෝ සාමාජිකයෙකු සම්බන්ධයෙන් නියෝගයක් ලබා දුන් විට එම සාමාජිකයා සිය තනතුරෙන් අස් වූ බවට සැලකේ.

(9) නිවාස ඉදිකිරීම් අධිකාරියේ පත්කරන ලද සාමාජිකයෙකු හෝ සභාපති කුමන හෝ අවස්ථාවක සිය සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වන්නේ නම් පළාත් අමාත්‍යවරයාට ලිඛිතව දැනුම් දීමෙන් අනතුරුව ඉල්ලා අස් විය යුතුය.

(10) නිවාස ඉදිකිරීම් අධිකාරියේ යම් සාමාජිකයෙකු රෝගාතුර වී වෛද්‍ය කරුණු හේතුවෙන්, හෝ දිවයිනෙන් බැහැරව යාම හෝ වෙනත් කිසියම් කරුණක් හේතු කොට ගෙන තාවකාලිකව සිය රාජකාරිය ඉටු කළ නොහැකි අවස්ථාවල,

(අ) එවැනි සාමාජිකයින් පත්කරන ලද සාමාජිකයෙක් වන්නේ නම් උප වගන්ති 3 (1) (අ) විධි විධානය සලකා පළාත් අමාත්‍යවරයා විසින් තවත් තැනැත්තෙකු එම සාමාජිකයා වෙනුවට පත් කළ හැකිය.

(ආ) එවැනි සාමාජිකයන් උප වගන්ති 3 (1) (ආ) යටතේ පත් කළවිට එම නිලධාරියාගේ පදවියට හිමිකම්වූ නිලධාරියෙක්

(11) නිවාස ඉදිකිරීම් අධිකාරියේ සභාපතිවරයාට සිය ශාරීරික හේතු, වෙනත් වෛද්‍ය කරුණු සහ දිවයිනෙන් බැහැරව යාම යන තාවකාලික කරුණු මත සිය රාජකාරිය ඉටු කළ නොහැකි අවස්ථාවකදී පළාත් අමාත්‍යවරයා විසින් වෙනත් පත්කරන ලද සාමාජිකයෙකු ඔහුගේ පුරප්පාඩුව සඳහා සභාපතිවරයා ලෙස කටයුතු කිරීමට පත් කළ යුතුය.

(12) නිවාස ඉදිකිරීම් අධිකාරියේ සියලුම හෝ කිසියම් සාමාජිකයෙකුට ඔවුන්ගේ ගෙවීම් දිමනා සහ අනෙකුත් වියදම් නිවාස අධිකාරියේ අරමුදලින් ගෙවීම් කළ යුතුය.

එසේ නමුත් එවැනි ගෙවීම් දීමනා සහ අනෙකුත් වියදම් ප්‍රධාන ලේකම් සමග සාකච්ඡා කිරීමෙන් පසුව අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශයන්ගෙන් අනතුරුව ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් ගෙවිය හැක.

04 (1) නිවාස ඉදිකිරීම් අධිකාරියේ සභාපතිවරයා විසින් සෑම රැස්වීම් වාරයකදීම මුලාසනය දැරිය යුතුය. යම් රැස්වීමක් සඳහා සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක එම රැස්වීම් සඳහා සහභාගි වූ සාමාජිකයින් විසින් තෝරාපත් කර ගනු ලබන සාමාජිකයෙක් එම රැස්වීමේහි මුලාසනය දැරිය යුතුය. නිවාස ඉදිකිරීම් අධිකාරියේ රැස්වීම් ක්‍රියා පටිපාටිය.

(2) නිවාස ඉදිකිරීම් අධිකාරියට අවශ්‍ය වූ විට එම අවස්ථාවන්හිදී රැස්වීම් පැවැත්විය යුතුය.

(3) නිවාස ඉදිකිරීම් අධිකාරියේ කුමන හෝ රැස්වීමක මූලාසනය දරණ තැනැත්තාට තමාට අයත් ඡන්දයට අමතරව තවත් තීරණාත්මක ඡන්දයක් භාවිතා කළ හැකිය.

(4) නිවාස ඉදිකිරීම් අධිකාරියේ රැස්වීම් සඳහා ගණ පූරණය මුළු සාමාජිකයින්ගෙන් 2/3 ක් විය යුතුය.

(5) නිවාස ඉදිකිරීම් අධිකාරියේ සාමාජිකයින්ගේ පුරප්පාඩුවක් තිබූ අවස්ථාවක ක්‍රියාත්මක කළ හැකි නමුදු එකී යම් ක්‍රියාවක් හෝ ක්‍රියා පටිපාටියක්, එකී සාමාජිකයින්ගේ පුරප්පාඩුවක් පවතින බව හෝ සාමාජිකයින් පත් කිරීමේ යම් දෝෂයක් තිබේ යන කරුණු මත බල රහිත යනුවෙන් සැලකිය නොහැක.

(6) මෙම ප්‍රඥප්තියේ විධි විධානවලට අනුකූලව නිවාස ඉදිකිරීම් අධිකාරියට එකී රැස්වීම් සහ එම රැස්වීම්වල ක්‍රියා පටිපාටිය සඳහා රීති සකස් කළ හැකිය.

නිවාස ඉදිකිරීම් අධිකාරියේ ලාංඡනය

05 (1) නිවාස ඉදිකිරීම් අධිකාරියේ ලාංඡනය සභාපතිවරයාගේ රැකවරණය යටතේ තිබිය යුතුය.

(2) නිවාස ඉදිකිරීම් අධිකාරියේ ලාංඡනය නිවාස ඉදිකිරීම් අධිකාරියේ තිරණයන් මත වෙනස් කළ හැකිය.

(3) නිවාස ඉදිකිරීම් අධිකාරියේ සභාපති ඇතුළු සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරිපිටදී හැර අන් අවස්ථාවලදී නිවාස ඉදිකිරීම් අධිකාරියේ ලාංඡනය යම් ලේඛනයක හෝ කිසිදු සාධන පත්‍රයක නොතැබිය යුතුය. එසේම එම සාමාජිකයින් දෙදෙනා සහභාගි වූ බව සනාථ කිරීම සඳහා එම ලේඛනයේ හෝ සාධන පත්‍රයේ හෝ ඔවුන් අත්සන් තැබිය යුතුය.

## II කොටස

## නිවාස ඉදිකිරීම් අධිකාරියේ බලතල, වගකීම් සහ ක්‍රියා පටිපාටිය

නිවාස ඉදිකිරීම් අධිකාරියේ බලතල වගකීම් හා ක්‍රියා පටිපාටිය

06 (1) නිවාස ඉදිකිරීම් අධිකාරියේ බලතල, වගකීම් හා ක්‍රියා පටිපාටිය වන්නේ ;

(අ) ජාතික නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති හැර පළාත් නිවාස ඉදිකිරීම් වැඩසටහන ආධාර ලබා දුන් ස්වකීය නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති සහ ව්‍යාපෘති දියත් කිරීම, පිළියෙල කිරීම, අධීක්ෂණ කිරීම සහ නිරීක්ෂණය කිරීම.

(ආ) පළාත් නිවාස ඉදිකිරීම් සංවර්ධන සැලසුම් ක්‍රමවත්ව සකස් කිරීම හා ඒවා පළාත් අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

(ඇ) කිසියම් හෝ පුද්ගලයෙකු සමඟ පළාත් අමාත්‍යවරයාගේ අවසරය ඇතිව පළාත් නිවාස ඉදිකිරීම් සංවර්ධන සැලසුම ඉටු කිරීමේ අරමුණට අවශ්‍ය යැයි සලකනු ලබන එවැනි ගිවිසුම් 1987 වර්ෂයේ 42 වැනි අංක දරණ පළාත් සභා පනතේ 16 වන වගන්තියේ ප්‍රකාරව ඇති කර ගැනිම ඍජුවම හෝ වක්‍රව හෝ ව්‍යාපෘති ලෙස දියත් කිරීම.

(ඈ) කිසියම් හෝ පුද්ගලයෙකු නිවාස කටයුතු සම්පූර්ණ කර ගැනිමට නොහැකිව සිටින විට එවැනි නිවාස සම්පූර්ණ කර දීමට හෝ ණය ලබා දීමට හෝ ඉදිකිරීම් අමුද්‍රව්‍ය ලබාදීමට භාර ගැනීම.

(ඉ) නිවාස ඉදිකිරීම් අධිකාරියට අදාළ පළාත් අමාත්‍යවරයාගේ අනුමැතිය ලත් එවැනි පළාත් සංවර්ධන නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති දියත් කිරීම.

(ඊ) කිසියම් චංචල හෝ නිශ්චල දේපළක් ලබා ගෙන භුක්තියේ තබා ගැනීම හෝ එසේ ලබා ගෙන භුක්තියේ තබා ගෙන ඇති එවැනි කිසියම් දේපළක් ඉවත් කිරීම.

(ල) කිසියම් හෝ නිවාස ඉදිකිරීම් ප්‍රදේශයකට මාර්ග, ජල, විදුලිය, ඉන්ධන, වායු, වාරි මාර්ග සහ යටිතල පහසුකම් සැපයිම.

(ළු) නිවාස ඉදිකිරීම් අධිකාරිය විසින් ලබා දෙනු ලබන කිසියම් හෝ සේවාවන්වලට ගාස්තු අය කිරීම.

(එ) නිවාස ඉදිකිරීම්වලට අවශ්‍ය අමුද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම නැතහොත් ආනයනය කිරීම සහ ලබා දීම.

(ඒ) මුදල් වශයෙන් හෝ වෙනත් අයුරකින් ලැබෙන ආධාර, තෑගි , මුදල් ආධාර සහ සහනාධාර ආදිය භාර ගැනීම තව ද නිවාස ඉදිකිරීම් අධිකාරිය එහි අරමුණු ඉටු කිරීම සඳහා ඒවාට ඉල්ලුම් කිරීම.

(ඔ) විදේශීය හා දේශිය වශයෙන් නිවාස ඉදිකිරීම් අධිකාරියේ සේවක පිරිසට පුහුණුවීම්, නිපුණතා සංවර්ධන ව්‍යාපෘති, පුහුණු පාඨමාලා සහ සැසිවාර ලබා දීමට සහ සහභාගි වීමට රජය හෝ නැගෙනහිර පළාත් සභාවෙන් සම්පාදනය කරනු ලබන රීති හෝ අනෙකුත් අධිකාරියන් විසින් පනවනු ලබන උපදේශයන් අනුව නිර්දේශ කිරීම.

(ඕ) මෙම ප්‍රඥප්තිය යටතේ බලතල, රාජකාරි සහ ක්‍රියාකාරකම් දියත් කිරීම සහ දියත් කිරීමට හෝ ඒ හා බැඳී හෝ එයට අදාළ ප්‍රතිවිපාක හෝ ක්‍රියාකාරකම් ඉටු කිරීම.

(2) උපවගන්ති (1) යටතේ බලතල, රාජකාරින් හා සෙසු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී හෝ දියත් කිරිමේදී නිවාස සැලසුම් හෝ නිවාස ඉදිකිරීම් සංවර්ධන සම්පාදනය කරමින් ක්‍රියාත්මක කිරීමේදී යම් රාජ්‍ය නියෝජිත හෝ සංස්ථාවක අයිතින් හෝ හිමිකම්වල හෝ ක්‍රියාකටයුතුවලට යම් හානියක් සිදුවේ යැයි නිවාස අධිකාරිය අදහස් කරන්නේ නම් එවැනි කරුණු කෙරෙහි එම ආයතනයන් සමග නිවාස අධිකාරිය සාකච්ඡාවන් පැවැත්වීම නිතීයට අදාල කරුණක් සේ සැලකිය යුතුවේ.

(3) මෙම ප්‍රඥප්තියේ නිවාස ඉදිකිරීම හෝ යම් ඉදිකිරීමක් ගොඩනැගිමේ දි නිවාස අධිකාරිය ඒ සඳහා බලපවත්නාවූ යම් පනතක විධිවිධාන, රීති, රෙගුලාසි හා වෙනත් පළාත් පාලන ආයතනයන්ගෙන් හෝ නාගරික සංවර්ධන අධිකාරිය හෝ වෙනත් යම් ආයතනයක් මගින් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇති අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන නිවාස සංවර්ධන අධිකාරිය අනුගමනය කිරීම නිතියට අනුකූල විය යුතු වේ.

07 (1) පළාත් අමාත්‍යවරයා විටින් විට සාමාන්‍ය හෝ විශේෂ නියමයන් නිවාස ඉදිකිරීම් අධිකාරිය වෙත එකී බලතල, වගකිම් සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දෙන අතර, නිවාස ඉදිකිරීම් අධිකාරිය එම නියමයන් ක්‍රියාත්මක කළ යුතුය. පළාත් අමාත්‍යවරයාගේ නියමයන්

(2) පළාත් අමාත්‍යවරයා විසින් නිවාස ඉදිකිරීම් අධිකාරිය වෙත ලිඛිතව විටින් විට නිවාස ඉදිකිරීම් අධිකාරියේ දේපළ ක්‍රියා පටිපාටි සම්බන්ධව එවැනි වාර්තාවන් ගිණුම් සහ තොරතුරු ඒ සඳහා වු ආකෘතියෙන් ලබා දෙන ලෙසට නියෝගයක් නිකුත් කලවිට නිවාස ඉදිකිරීම් අධිකාරිය එවැනි නියමයන් ක්‍රියාත්මක කළ යුතුය

08 නිවාස ඉදිකිරීම් අධිකාරියේ එකී සභාපතිවරයාට හෝ යම් නිළධාරියෙකුට යම් බලතල, වගකිම් සහ ක්‍රියා පටිපාටියන් මෙම ප්‍රඥප්තියේ විධි විධානවලට අනුකූලව ලිඛිතව ලබා දෙනු ඇත. නිවාස ඉදිකිරීම් අධිකාරියේ බලතල බෙදා දීම යනාදිය

## III කොටස

### නිවාස ඉදිකිරීම් අධිකාරියේ මානව සම්පත්.

09 (1) පළාත් අමාත්‍යවරයාගේ පූර්ණ අනුමැතියෙන් නිවාස ඉදිකිරිම් අධිකාරිය යම් සාමාන්‍යාධිකාරිවරයෙකු නිවාස ඉදිකිරිම් අධිකාරියට පත් කරනු ලබයි නිවාස ඉදිකිරිම් අධිකාරියේ සාමාන්‍ය අධිකාරි

(2) නිවාස ඉදිකිරීම් අධිකාරියේ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වූ නියමයන්ට අනුකූලව සාමාන්‍යාධිකාරිවරයා නිවාස ඉදිකිරීම් අධිකාරිය සංවර්ධනය සහ බලතල, ක්‍රියාකාරකම් සහ වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටියට වගකීම් දරනු ඇත.

(3) සාමාන්‍යාධිකාරවරයා නිවාස ඉදිකිරීම් අධිකාරියේ ලිඛිත අනුමැතිය මත නිවාස ඉදිකිරීම් අධිකාරියේ කුමන හෝ නිළධාරීයෙකුට ඔහු විසින් විටින් විට අවශ්‍ය වන බවට තීරණය කරනු ලබන සිය බලතල ක්‍රියාත්මක කිරීම සහ රාජකාරිය භාර දෙනු ලබන අතර, එසේ බලතල ක්‍රියාත්මක කිරීම සහ රාජකාරී භාරදුන් නිළධාරීන් එසේ සාමාන්‍යාධිකාරිවරයාගෙන් පොදු සහ විෂයය නියමයන් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

(4) පළාත් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියෙන් තොරව සාමාන්‍යාධිකාරිවරයා ධුරයෙන් පහ කළ නොහැකිය.

නිවාස ඉදිකිරීම් අධිකාරිය සඳහා කාර්ය මණ්ඩලය පත් කිරීම් යනාදිය

10 (1) ලේකම්, ප්‍රධාන ලේකම් සමග සාකච්ඡා කර ආණ්ඩුකාරවරයාගේ අනුමැති ප්‍රකාරව ;

(අ) නිවාස ඉදිකිරීම් අධිකාරියේ ක්‍රියාකාරකම් කාර්යක්ෂම නැංවීමේ අරමුණින් අවශ්‍ය කාර්යය මණ්ඩල පත් කෙරේ

(ආ) එවැනි මානව සම්පත් සඳහා වූ වැටුප් සහ දීමනා තිරණය කෙරේ

(ඇ) එසේ මානව සම්පත් සඳහා වූ නිති රීති සහ කොන්දේසි තිරණය කරනු ලබන සහ

(ඈ) එවැනි මානව සම්පත් සඳහා වූ සුභ සාධන ව්‍යාපෘති හෝ අර්ථ සාධක අරමුදල් යනාදිය ස්ථාපනය කිරීම හා එවැනි ව්‍යාපෘතිවලට හෝ අරමුදලට දායක වීම.

(2) රාජ්‍ය සේවයේ සිටින කුමන හෝ නිළධාරියෙක් නිවාස ඉදිකිරීම් අධිකාරියේ ඉල්ලීම මත තාවකාලිකව නිදහස් කොට නිවාස ඉදිකිරීම් අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා නිවාස ඉදිකිරීම් අධිකාරියෙන් තීරණය කරනු ලබන කාලපරිච්ඡේදයක් වෙනුවෙන් පත් කිරීමේදී ආයතන සංග්‍රහයේ සහ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රිති සංග්‍රහයෙහි විධිවිධානවලට අනුකූලව සිදුකල යුතුය.

## IV කොටස

## මුදල්

නිවාස ඉදිකිරීම් අධිකාරියේ අරමුදල්

11 (1) නිවාස ඉදිකිරීම් අධිකාරිය සතු අරමුදලක් පවතී. මින් මතු, "අධිකාරියේ අරමුදල" යනුවෙන් හැඳින්වනු ලැබේ.

(2) නිවාස ඉදිකිරීම් අධිකාරිය වෙනුවෙන් පහත සඳහන් ලැබීම් ප්‍රථම වතාවට පළාත් අරමුදලට ගෙවිය යුතු අතර, මින් මතු එම මුදල් අධිකාරියේ අරමුදලට බැර කළ යුතුය

(අ) නැගෙනහිර පළාත් සභාවෙන් කලින් කලට නිවාස ඉදිකිරීම් අධිකාරිය වෙනුවෙන් කැමැත්තෙන් වෙන් කරන ලද සියළු මුදල්

(ආ) මෙම ප්‍රඥප්තියේ අරමුණ හේතුකොට ගෙන පුද්ගලයන් සහ රාජ්‍ය නොවන ආයතන විසින් අධිකාරිය ලබා ගන්නා ලද සියළු මුදල්

(ඇ) නිවාස ඉදිකිරීම් අධිකාරියේ ක්‍රියාකාරකම්, වගකීම් සහ බලතල ක්‍රියාවට නැංවීමේ දී ලබා ගන්නා ලද එවැනි සියළු මුදල්

(ඈ) නිවාස ඉදිකිරීම් අධිකාරියට බැර කරන ලද සියළු ඒකාබද්ධ මුදල්

(3) නිවාස ඉදිකිරීම් අධිකාරිය මෙම ප්‍රඥප්තියේ නියමයන්වලට අනුකූලව අධිකාරියේ මූල්‍ය නඩත්තු කෙරේ.

(4) නිවාස ඉදිකිරීම් අධිකාරිය එකී අරමුදල කලින් කලට බලය පවරන ලද එහි කළමනාකරණය සහ ක්‍රියා පටිපාටි ගනුදෙනු, සාමාජිකයින්ගේ දීමනා සහ වියදම්, ගෙවීම් මෙම ප්‍රඥප්තිය 10

වන වගන්තියේ විධිධිධානවලට අනුව පත්කරනු ලබන සේවකයින් සඳහා ගෙවීම, මෙම ප්‍රඥප්තිය සහ වෙනත් ලිඛිත නීතිය යටතේ නිවාස ඉදිකිරීම් අධිකාරියේ බලතල ක්‍රියා පටිපාටිය හා වගකිම් භාවිතා කිරීමේදි සහ එවැනි අරමුණු වලින් නිවාස ඉදිකිරීම් අධිකාරියට වැයවන වියදම් සම්පූර්ණ කිරීමේ අරමුණින් භාවිතා කල හැකිය.

(5) නැගෙනහිර පළාත් සභාව මගින් වෙන්කර දෙනු ලබන එවන් මුදල් 1987 වර්ෂයේ අංක 42 දරන පළාත් සභා පනතේ 19 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව විය යුතු අතර පළාත් අමාත්‍යවරයා ආණ්ඩුකාරවරයා සමග සම්බන්ධවී සාකච්ඡා කිරීම මත පළාත් මුදලින් එය වාරික වශයෙන් ගෙවනු ලබන අතර එවැනි මුදල් උප වගන්ති (1) යටතේ ස්ථාපිත කරන ලද අධිකාරියේ අරමුදලට බැර කලයුතුය.

(6) අධිකාරියේ මූල්‍ය පාලනය සහ ක්‍රියාකාරකම් 1987 වර්ෂයේ අංක 42 දරණ පළාත් සභා පනතේ III කොටසට අදාළ විය යුතුයි.

12 නිවාස ඉදිකිරීම් අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ එකි බලතල ක්‍රියාත්මක කිරීමේදී සහ රාජකාරි ඉටු කිරීමේදී නිවාස ඉදිකිරීම් අධිකාරියට වගකිම් ලෙස පැවරී ඇති අදාල අවශ්‍යතා සපුරාලීම සඳහා පළාත් අමාත්‍යවරයාගේ අනුමැතිය මත 1987 වර්ෂයේ අංක 42 දරණ පළාත් සභා පනතේ 21 වැනි වගන්තිය යටතේ විධිවිධාන සලසා ඇති නියමයන්ට අනුකූලව ණය මුදලක් ලබා ගත හැකිය. *නිවාස ඉදිකිරීම් අධිකාරියට ණය පහසුකම් ලබා ගැනීමේ බලය*

13 (1) නිවාස ඉදිකිරීම් අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතුය. *නිවාස ඉදිකිරීම් අධිකාරියේ මුදල් වර්ෂය සහ විගණනය*

(2) නිවාස ඉදිකිරීමේ අධිකාරියේ ආදායම් සහ වියදම් වත්කම් සහ වගකීම් සහ අනෙකුත් සියළු ගනුදෙනු පිළිවෙලින් ගිණුම් පොත් පත්වල තැබීමට අවශ්‍ය කටයුතු නිවාස ඉදිකිරීම් අධිකාරියෙන් සිදුකල යුතුය

(3) පොදු සංස්ථා විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තියේ විධි විධානවලට අනුකූලව රජය සහ විගණකාධිපති සමග නිවාස ඉදිකිරීම් අධිකාරිය විගණනය සඳහා වූ වගකීමට පූර්වයෙන් ලබා ගත් එකගත්වයට යටත්ව කොන්දේසිවලට අනුකූලව විගණනය කිරීම සුදුසු වේ.

## V කොටස

### පොදු

14 නිවාස ඉදිකිරීම් අධිකාරිය අවසන්වූ ලිත් වර්ෂය සඳහා මුදල් සහ පරිපාලන වාර්තා ඊලග වර්ෂයේ පලමු වන කාර්තුව තුල නොපමාව නැගෙනහිර පළාත් සභාව ඉදිරියේ ඉදිරිපත් කල යුතුය. *වාර්ෂික වාර්ථා නැගෙනහිර පළාත් සභාව ඉදිරියේ ඉදිරිපත් කිරීම*

15 (1) නිවාස ඉදිකිරීම් අධිකාරියට එකී කළමණාකරණය සම්බන්ධව හෝ සියලු හෝ යම් කරුණක් සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ අවශ්‍ය වන්නා වූ හෝ බලය පවරන්නා වූ කරුණු සම්බන්ධයෙන් රීති සකස් කළ හැක. *නිවාස ඉදිකිරීම් අධිකාරියට රීති සකස් කිරීමේ බලය*

(2) නිවාස ඉදිකිරීම් අධිකාරිය විසින් මෙම ප්‍රඥප්තිය යටතේ සම්පාදනය කරන්නා වූ කිසියම් රීති පළාත් අමාත්‍යවරයාගේ අනුමැතිය, නැගෙනහිර පළාත් සභාවේ නිර්දේශයන් සහ එවැනි නිර්දේශයන් ගැසට් නිවේදනයේ පළ කිරීමෙන් අනතුරුව බලාත්මක කරනු ලබයි.

16 (1) නිවාස ඉදිකිරීම් අධිකාරියෙන් යම් නිශ්චල දේපලක් එකී ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අවශ්‍ය වන අවස්ථාවල එවැනි අත්පත් කර ගැනිම සම්බන්ධයෙන් පළාත් අමාත්‍යවරයා විසින් අනුමත කළ යුතු අතර, එය පොදු අවශ්‍යතාවය සඳහා අත්පත් කරන බවට සැළකිය යුතුය. තව ද එය ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ විධිවිධානවලට අනුකූලව අත්පත් කර නිවාස ඉදිකිරීම් අධිකාරියට භාර දිය යුතුය. එවැනි අත්පත් කර ගැනීම් සඳහා වූ යම් මුදල් ගෙවීමක් නිවාස ඉදිකිරීම් අධිකාරියේ අරමුදලින් ගෙවිය යුතුය. *ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ ලබා ගැනීම*

(2) නිවාස ඉදිකිරීම් අධිකාරියේ ක්‍රියා පටිපාටිය සඳහා නැගෙනහිර පළාතේ පළාත් මායිම තුළ යම් රජයේ ඉඩමක් අවශ්‍ය වූ විට පළාත් අමාත්‍යවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වෙනි

සංශෝධනයේ ඇමුණුම් II හි කරුණු 1-1:2 අනුකූලව ක්‍රියාත්මක කොට නැගෙනහිර පළාත් සභාව මගින් නිවාස ඉදිකිරීම් අධිකාරියට එවැනි ඉඩමක් ලබා ගැනීම සහ එය පරිපාලනය සහ පාලනය කර භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ.

| | | |
|---|---|---|
| යම් ඉඩමකට හෝ පදිංචියට ඇතුල් වීම සඳහා වූ බලය | 17 | නිවාස ඉදිකිරීම් අධිකාරියේ සභාපතිවරයා හෝ ඔහු විසින් ලිඛිතව සාමාන්‍ය හෝ විශේෂ බලය පවරන ලද යම් නිළධාරියෙක් හෝ නිළධාරීන්ට නිවාස ඉදිකිරීම් අධිකාරියේ යම් රාජකාරියක් හෝ ක්‍රියාවක් ක්‍රියාත්මක කිරීමට යම් සාධාරණ අවශ්‍යතාවයක් බවට හැඟී යන කරුණක් හෝ යම් විමර්ශනයක් සිදු කිරීමට හෝ පරීක්ෂණයක් සිදු කිරීමට, නිවාස ඉදිකිරීම් අධිකාරියේ යම් ක්‍රියා පටිපාටියක් නංවා ගැනීමට, ඉඩමේ හෝ පදිංචි ස්ථානයේ හිමිකරු හෝ සන්තකයේ තබා ගන්නා තැනැත්තන්ට අවම වශයෙන් දින 03 කට පෙර දැනුම් දීමකින් අදාළ නිවසට හෝ ඉඩමට ඇතුල් වීම නිත්‍යානුකූල වේ. |
| වරදවල් හා දඬුවම් | 18 | මෙම ප්‍රඥප්තියේ හෝ යම් රීතිවල නියෝගය සහ නියමයන් හෝ ඒ මගින් ලබා දී ඇති අවශ්‍යතාවයන්, ප්‍රතිපාදනයන් නොපිළිපදින හෝ උල්ලංඝනය කරන තැනැත්තන් මෙම ප්‍රඥප්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් වන බවටත්, එය මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නොවන විභාගයකින් පසුව වරදකරු වූ විට රුපියල් 1,000/- කට නොවැඩි දඩ මුදලක් හෝ අවුරුදු 02 කට නොවැඩි සිර දඬුවමක් හෝ දෙයාකාරයකින් දඬුවම් නියම කළ හැකිය. |
| අර්ථ නිරූපනය | 19 | මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස |

"රජයේ නියෝජිතයා" යන රජයේ දෙපාර්තමේන්තු හෝ සංස්ථාව ඇතුළත් වේ.

"නිවස වැඩිදියුණු කිරීම" යම් නිවසක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට හැගෙන සාමාන්‍ය අලුත් වැඩියාවන්ගෙන් ඔබ්බට පෙර නිර්මාණය කරන ලද නිවසක එය පිළියෙල කිරීම සඳහා කරනු ලබන කාර්යයන් හෝ කටයුත්තක් හෝ අලුත් වැඩියාවක්

"පළාත් පාලන ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන්නේ මහ නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත, ප්‍රාදේශිය සභා පනත හෝ යම් පනතක් යටතේ පිළියෙල කරන ලද යම් ආයතනයක හෝ එයට සමගාමී වූ බලතල, වගකීම් සහ ක්‍රියා පටිපාටි භාවිතා කරනු ලබන එවැනි ආයතන හෝ සභාවන් වේ.

"පොදු සංස්ථා" යනුවෙන් හඳුන්වනු ලබන්නේ සමාගම් පනතට යටත්ව හෝ යම් ලිඛිත පනතක් යටතේ ස්ථාපනය කරනු ලැබූ එකී මුල්‍ය සහ ආයෝජන සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් රජයෙන් තෑග්ගක් හෝ ණය මුදලක් සේ හෝ වෙනත් ආකාරයෙන් ලබා දුන් සමූහ ව්‍යාපාරයක් හෝ ආයතනයක් වේ.

"නිවාස ඉදිකිරීම" යනුවෙන් හඳුන්වනු ලබන්නේ මිනිස් වාසස්ථාන සඳහා භාවිතා කරනු ලබන හෝ ඒ අරමුණින් ඉදිකරන ලද ගොඩනැගිල්ල හෝ ගොඩනැගිලි හෝ නිර්මාණ

"නිවාස සංවර්ධනය" යනුවෙන් හඳුන්වනු ලබන්නේ නව නිවසක් ඉදිකිරීමේ හෝ නඩත්තු කිරීමේ හෝ පූර්ව ඉදි කරන ලද නිවසක් වැඩි දියුණු කිරීමක්,

"අමාත්‍ය මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ඊ වැනි පරිච්ඡේදයේ විධිවිධානයට අනුකූලව නැගෙනහිර පළාත් සභාව වෙනුවෙන් ස්ථාපිත කරන ලද අමාත්‍ය මණ්ඩලයකි.,

"ප්‍රධාන ලේකම්" යනුවෙන් හඳුන්වනු ලබන්නේ 1987 වර්ෂයේ 42 අංක දරණ පළාත් සභා පනතේ 31 වන වගන්තියේ විධිවිධානයට අනුකූලව නැගෙනහිර පළාත් සභාව වෙනුවෙන් පත්කරන ලද ප්‍රධාන ලේකම් වේ,

"ලේකම්" යනුවෙන් හඳුන්වනු ලබන්නේ නිවාස ඉදිකිරීම් යන විෂයන් නැගෙනහිර පළාත් සභාවේ කුමන අමාත්‍යංශය යනුවෙන් වෙන් කරන ලද හෝ අදාල අමාත්‍යංශයේ ලේකම් වේ.

| | | |
|---|---|---|
| කිසියම්ම වෙනසක් ඇති වූ අවස්ථාවේ දී දෙමළ භාෂාව පිළිගනු ලැබේ. | 20 | මෙම ප්‍රඥප්තිය දෙමළ භාෂාව හා සිංහල භාෂාව අතරේ භාෂා අන්දමින් කිසියම්ම ආරවුලක් පැන නැගු අවස්ථාවේ දී දෙමළ භාෂාවෙන් යුතු කරුණු පිළිගනු ලැබේ. |

02-259

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.